SRI LANKA EXPORT DEVELOPMENT BOARD
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை

EDB SRI LANKA

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

# REQUEST FOR PROPOSALS (RFP)

## Procurement of a Service Provider for Website Revamp & Digital Marketing Campaign to Enhance Global Visibility of Sri Lanka's ICT Sector - 2026 Sri Lanka Export Development Board (EDB)

**කොන්ත්‍රාත් අංකය: EDB/PU/NCB/2026/04**

1. කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB), Website Revamp & Digital Marketing Campaign to Enhance Global Visibility of Sri Lanka's ICT Sector - 2026 වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ආයතනයක් තෝරා ගැනීමට සැලසුම් කර ඇත.

2. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපතිවරයා විසින්, "Website Revamp & Digital Marketing Campaign to Enhance Global Visibility of Sri Lanka's ICT Sector - 2026" සඳහා සුදුසුකම් ලත් සහ වෘත්තීය සේවා සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

3. මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2024 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ (NCB – Single Stage Two Envelope Bidding Procedure) ක්‍රමවේදය යටතේ සිදු කරනු ලබන අතර, මාර්ගෝපදේශවල සඳහන් සියලු සුදුසුකම්ලත් ලංසුකරුවන්ට විවෘත වේ.

4. කොන්ත්‍රාත්තුව ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාදු ලේඛනගත (Blacklisted) කර නොතිබිය යුතුය. සුදුසුකම් ලත් ලංසුකරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් පහත පරිදි වේ (අමතර අවශ්‍යතා ප්‍රසම්පාදන ලේඛනවල සඳහන් කර ඇත).

   a) සාමාන්‍ය පළපුරුද්ද

   සේවා සැපයුම්කරුට වෙබ් අඩවි සංවර්ධනය සහ ඩිජිටල් අලෙවිකරණ විසඳුම් සැපයීමේ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, එයින් අවම වශයෙන් වසර 01 ක ජාත්‍යන්තර ව්‍යාපෘති පළපුරුද්දක් තිබිය යුතුය.

   b) කොන්ත්‍රාත්තු පිළිබඳ විශේෂ පළපුරුද්ද

   පසුගිය වසර 05 තුළ,

   - වෙබ් අඩවි සංවර්ධනය, අන්තර්ගත වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම සම්බන්ධ සමාන ව්‍යාපෘති 02 ක් සහ
   - ඩිජිටල් අලෙවිකරණ සම්බන්ධ සමාන ව්‍යාපෘති 02 ක් සාර්ථකව නිම කර තිබිය යුතුය.

   c) මූල්‍ය හැකියාව

   ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපතක් සහ පසුගිය වසර 03 සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා ඉදිරිපත් කළ යුතුය.

5. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු පහත ලිපිනයෙන් ලබා ගත හැකිය. සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන), 6 වන මහල, NDB–EDB Tower, අංක 42, නවම් මාවත, කොළඹ 02, දුරකථන: 011-2300702, විද්‍යුත් තැපැල: [disna@edb.gov.lk]

6. ප්‍රසම්පාදන ලේඛන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ **https://www.srilankabusiness.com/announcements** වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය. මුද්‍රිත පිටපත්ද ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකිය. ලංසුවක් වලංගු ලෙස සලකා බැලීම සඳහා, ආපසු නොගෙවන රු.1,000.00 ක ගාස්තුවක් ලංසු ලේඛනවල සඳහන් බැංකු ගිණුමට ගෙවා, ගෙවීම් පත්‍රිකාවේ මුල් පිටපත හෝ EDB රිසිට්පත ලංසුව සමග අමුණා තිබිය යුතුය. මීට අමතරව, ගෙවීම් පත්‍රිකාවේ ස්කෑන් කරන ලද පිටපතක් ලංසු ඉදිරිපත් කිරීමට පෙර 5 වන ඡේදයේ දක්වා ඇති විද්‍යුත් තැපැල් ලිපිනයට විද්‍යුත් තැපැල් කළ හැකිය.

7. ලංසුවේ මුල් පිටපත ආවරණයක බහා, එහි වම්පස ඉහළ කෙළවරේ පහත සඳහන් පරිදි සටහන් කළ යුතුය:

   "EDB/PU/NCB/2026/04" – "Procurement of a Service Provider for Website Revamp & Digital Marketing Campaign to Enhance Global Visibility of Sri Lanka's ICT Sector - 2026" එසේම ලංසුව ඉදිරිපත් කරන ආයතනයේ නම ආවරණය මත සඳහන් කළ යුතුය.

8. ලංසු 2026 සැප්තැම්බර් 29 දින පස්වරු 2.00 ට පෙර ඉහත සඳහන් ලිපිනයට භාර දිය යුතුය. ප්‍රමාද වූ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කිරීම 2026 සැප්තැම්බර් 29 දින පස්වරු 2.15 ට 7 වන මහලේ කුඩා සම්මන්ත්‍රණ ශාලාවේ (Mini Conference Room) දී පැවැත්වේ, සහභාගී වීමට කැමති ලංසු කරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ සිදු කරනු ලැබේ. සියලු ලංසු සමග රු. 50,000.00 කට නො අඩු බැංකු ඇපකරයක් ආකාරයෙන් ලංසු ආරක්ෂාවක් (Bid Security) තිබිය යුතුය.

9. පූර්ව ලංසු රැස්වීම (Pre-Bid Meeting) **2026 සැප්තැම්බර් 21 දින පෙරවරු 10.00 ට** EDB ආයතනයේ 9 වන මහලේ මණ්ඩල රැස්වීම් කාමරයේ (BoardRoom) දී පැවැත්වේ. උනන්දුවක් දක්වන සියලු ලංසු කරුවන්ට එයට සහභාගී විය හැකිය.

**සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**NDB – EDB Tower,**
**අංක 42, නවම් මාවත, කොළඹ 02**
**වෙබ් අඩවිය: [www.srilankabusiness.com]**

**2026 සැප්තැම්බර් 15**